

# සැඳෑව

ශ්‍රී ලංකා
මහ බැංකු විශ්‍රාමිකයන්ගේ
සංගමය
2013 ඔක්. / දෙසැ. කලාපය.



වෙබ් අඩවිය : www.sendewa.org විද්‍යුත් ලිපිනය info@cbpa.com
අංක : QD/55/News/2013 යටතේ ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලදී.




# Sadder side of Christmas

Christmas is a time of prayer, rejoicing, family get-togethers, carol singing and general merriment. But in the midst of these joyous reunions there are families for whom the joy of Christmas is tinged with sadness. These are families who have lost a loved one and for whom Christmas brings a sad reminder.

This was brought to my mind recently when I came across some pictures taken at one of the Central Bank's Carol Services. The Central Bank has a long tradition going back to the early 1950s of holding a Carol Service in the Foyer of the Bank's building in Janadhipathi Mawatha. This was in the old Central Bank building which was destroyed in the bomb blast of 1996. I realised that some of those in the pictures were victims of the bomb blast while with the pssing of the years some of the others are now no more.

These include Dr.H.N.S.Karunatilleke, S.Easparathasan, Dr. Uthum Herat, D.Mortimer, Mrs.Sirancie T. Goonewardene, Lyle Godridge, Piloo Lakdawalla and Iona Garth. The pictures show the camaraderie that prevailed at these services and helped to bring on the spirit of Christmas. The fact that many of them are now no more is a reminder of the sadness that pervades the homes of some families at Christmas time.

Christmas is also a time to remember our missing loved ones. The following lines poignantly reflect the feelings of those for whom Christmas can also be a painful reminder of their missing loved ones.

" Lord there sit apart in lonely plces
On this the gladdest night of all the year
Some stricken ones with sad and lonely faces



Cont. 2.

Cont. 1.



For whom the thought of Christmas brings no cheer
Lord some sit by lonely hearthstones sobbing
Who feel this night all earthly love denied
Who hear but dirges in the loud bells throbbing
For loved ones lost who blessed last Christmastide
For these O Father our petition hear
And send the loving Christ Child very near"

**by Terrence Savundranayagam.**

# තුන්දින චාරිකාවට සූදානම් වෙමු !

සීත කාලයේදී ගින්දරත්, ගිනියම් කාලයේදී ජලයත්, ළදරුවන්ගේ තොඳෙල් වදනුත්, ප්‍රිය මිතුරු මිතුරියන්ගේ හමුවත් ලබා දෙන්නෙ මිහිරක්මයි. සතුටක්මයි. විශේෂයෙන්ම කාලයක් එකට හිටිය සහෘදයන් යළි යළිත් හමුවීම ලබා දෙන්නෙ මානසික සතුටක්. මිහිරක්. ඒ වගේ ඉඳ හිටල හමුවීම නම්කරන්න පුළුවන් 'සුහද හමුවක' කියල. නවීන තාක්ෂණය හරහා කනත් කටත් අතර හුවමාරු දුරකින් එකිනෙකා හමු වුනත්, ඇසට අසුවන මායිමේ ඉන්නව නම් ඉස්සර තිබුනු දයාබර බව සුවඳ දී දී දැනෙන්න ගන්නව. ඒක කොච්චර ලෙන්ගතු ද කියල කියන්න වචනත් නැහැ. ඒක දැනෙන්න නම් මුහුණට මුහුණ හමුවෙන්නම ඕන.

ශ්‍රී ලංකා මහ බැංකුවෙ විශ්‍රාමිකයන්ගේ සංගමයෙ මෙම විධායක කමිටුවේ නිල කාලය තුළ දී සැලසුම් කළ දින තුනේ චාරිකාව පෙබරවාරි මස 7, 8 හා 9 වැනි දිනට යොදා ගෙන තියෙනව. චාරිකාව යන්න සැලසුම් කරල තියෙන්නෙ නැගෙනහිර පලාතට. ඒ කියන්නෙ විශේෂයෙන්ම **ත්‍රිකුණාමලයට**. එදා ජන කවියා ත්‍රිකුණාමලය ගැන කිව්වෙ මෙහෙමයි. ඔබට මතකත් ඇති.

මලේ මලේ තැඹිලිය වැන්න පොල් මලේ
රළේ රළේ, මූදෙන් දමන දිය රළේ
බලේ බලේ රාසිහ දෙයියන්ගෙ බලේ
ගලෙන් කොටුව බැන්දයි තිරිකුණා මලේ

මේ චාරිකාව සංවිධානය කර ගැනීමට විශාල වැඩ කොටසක් තියෙනව. විශේෂයෙන්ම නවාතැන් පහසුකම්, කෑම්බීම්, නරඹන ස්ථාන හා ගමනා ගමන පහසුකම් ආදිය මූලිකයි. ඒ සඳහා මෙම චාරිකාවට සහභාගි වීමට බලාපොරොත්තුවන සාමාජිකයන් 2014 ජනවාරි මස 05 වැනි දිනට හෝ ඊට පෙර සංගමයේ උප ලේකම්ට (038 2234226) දැනුම් දී ආසන වෙන් කරවා ගන්න. දැනුම්දීමේ අංකයක් ලබා ගන්න. චාරිකාවේ වැඩි විස්තර පසුව දැනුම් දෙනු ලැබේ.

සංගමයේ පැවැත්ම වෙනුවෙන් කළ යුතු වැඩ කටයුතු රාශියක් තියෙනවා. තුන් දින චාරිකාව ඉන් එකක්. ජ්‍යෙෂ්ඨ පුරවැසි පිරිසක් කැටුව චාරිකාවක් යෑම ලොකු වගකීමක්. ඒක සාමූහික වගකීමක් වගේම සාමූහික සංවිධාන කාර්යයක්. චාරිකාව යන්නේ කොතැනට ද, එම ස්ථානවල සෞන්දර්ය සහ ඓතිහාසික පසුබිම, නවාතැන්වල මූලික පහසුකම්, ආහාර පාන හා එහි ප්‍රමාණය, ආරක්ෂාව, ඉඩකඩ ප්‍රමාණය, සේවාවන්ගේ තත්ත්වය ආදී විවිධ අංශ ගැන සංවිධායනය කිරීමේදී සැලකිලිමත් වෙන්න තියෙනව.

ඉතිං ඒ සඳහා කල්වේලා ඇතුව දැනුම් දී නියමිත දිනට කලින් මුදල්ගෙවා පැමිණීම සහතික කිරීම චාරිකාව සංවිධානයට පහසුවක්.

# ඇත්තටම ඇමෙරිකාව ..... ?!

**හැඳින්වීම**

ඇමෙරිකාව යන නම ඇසූ පමණින්ම බොහෝ දෙනාගේ සිත්තුළට එක්වරම ඇතුළුවනුයේ, ලෝකයෙන්ම සංකර, අසංවර, මිනී මරුවන්ගෙන් සපිරි, ලෝක ප්‍රකට මාෆියා සංවිධාන රටපුරා ක්‍රියාත්මක වන, මංකොල්ලකරුවන් නිදැල්ලේ හැසිරෙන, ජනාකීර්ණ, එහෙත් ඕනෑම කෙනෙකුට මුදල් ඇත්නම්, ඕනෑම දෙයක්, ඕනෑම තැනකින් අවහිරයකින් තොරව ලබාගත හැකි, ඕනෑම විදියකට ජීවත්විය හැකි අංක එකේ "අරාජික" රටක් බවය. එහෙත් ඇමෙරිකාවට ඇතුළු වූ විගසම මේ ඒ කියන රට දැයි ප්‍රශ්න වැලකට මුහුණ දීමට කාටවුනත් සිදුවන බව නම් නොකියාම බැරිය. මෙන්න ඇමෙරිකාවේ සංචාරයකින් ලත් අත්දැකීම් කිහිපයක්.

**ශ්‍රී ලංකාවෙන් ඇට්ලන්ටාවට**

පසුගිය වසරේ දෙසැම්බර් මාසයේ දී අපටත් ඒ අවස්ථාව උදාවිය. ඇමෙරිකාවේ මිචිගන් රාජ්‍ය විශ්ව විද්‍යාලයෙන් ආචාර්ය උපාධිය අවසන් කළ අපගේ දියණියගේ උපාධි ප්‍රදානෝත්වයට සහභාගී වීමේ වාසනාව ලත් අප ඇමෙරිකාවට ඇතුළු වූයේ "**ඇට්ලන්ටා**" ගුවන් තොටුපලෙනි. ඇමෙරිකාව යනු සුදු මිනිසුන්ගේ රටක් වශයෙන් සිතා සිටි නමුත්, "ඇට්ලන්ටා" ගුවන් තොටුපලට පය තැබූ සැනින් අපට දක්නට ලැබුනේ මෙය රතු ඉන්දියානුවන් ලෙස හඳුන්වනු ලබන කළු මිනිසුන්ගේ ආධිපත්‍ය පතුරුවා ඇති රාජධානියක් ලෙසය. ඒ තරමට ඇට්ලන්ටා ගුවන් තොටුපලේ සේවයේ යෙදී සිටියේ කළු ජාතිකයන්ය. එයිනුත් වැඩි පිරිස කළු කාන්තාවන් වීම විශේෂත්වයකි. මගීන් දස දහස් ගණනක් මෙහෙයවන මෙම ගුවන් තොටුපලේ දැකිය හැකි සිය ගණනක් සේවා කවුන්ටර් වලින් සෑම එකකම සේවයේ යොදවා ඇත්තේ එවැනි කාන්තාවන්ය. ඔවුන් ඉතා ක්‍රියාශීලිය. එබැවින්, මෙතරම් සුවිශාල ගුවන් තොටුපලක වුවද කිසිදු අවුල් සහගත තත්ත්වයක් හෝ කලබලකාරිත්වයක් දක්නට නොලැබුණි.



**ඉන්ඩියානා පොලිස් කරා....**

ඇට්ලන්ටා ගුවන් තොටුපලේ සිට අභ්‍යන්තර ගුවන් තොටුපලක් වන **ඉන්ඩියානා පොලිස්** නැමැති ගුවන් තොටුපල දක්වා ගුවනින්ම ගමන් කිරීමට අපට සිදුවිය. ජාත්‍යන්තර ගුවන් තොටුපලක් නොවුවත් එයද, කටුනායක මෙන් කීප ගුණයක් විශාල නමුත් කිසිදු කලබල ස්වභාවයකින් තොර, ක්‍රමානුකූලව ක්‍රියාත්මක වන, සැනසිලිදායක ගුවන් තොටුපලක් බව අපට අවබෝධවූයේ නිරායාසයෙනි. ගුවන් යානයෙන් බැස මිනිත්තු පහක තරම් සුළු වේලාවක දී ආගමන විගමන කටයුතු අවසන් වූ අතර, ඒ වනවිටත් අප සතු ගමන් මළු සියල්ල නියමිත ස්ථානයේදී ලබාගත හැකිවීම පුදුම සහගතය. ඊටත් වඩා පුදුමය නම් කිසිදු ගමන් මල්ලක් විවෘත කර නොතිබුණු අතර ඒවා ඉතාම ආරක්ෂාකාරිව තිබිමය. මේ ගැන විමසා බැලීමේදි අපට දැන ගන්නට ලැබුණේ, නවීන විද්‍යාත්මක උපකරණ භාවිතා කරමින්, ගමන් මළු විවෘත නොකරම ඒවා පරීක්ෂා කිරීමේ හැකියාව ඔවුන් සතු බවය. මෙය කෙතරම් පහසු ක්‍රමයක්දැයි ගුවන්

'පහසුව' කියන්නේ දෙයක් සිදුවිය යුතු විදියට සිදුවීම හෝ කළයුතු විදියට කිරීමටයි. අපහසුව කියන්නෙ ඒකෙ අනික් පැත්තට. සිදුවිය යුතු දේ සිදු නොවිය යුතු විදියට සිදු වීමත්, කළ යුතු දේ නොකළයුතු විදියට කිරීමත් තමයි අපහසුව. තම තමන්ම උදාහරණයට ගන්නව නම්, කවුරුවත් කැමති නැහැනේ අපහසුවට පත් වෙන්න. කවුරුත් බලන්නෙ පහසුවෙන් කටයුතු කර ගන්න. තුන්දින චාරිකාවේ සංවිධාන කටයුතු වඩ වඩාත් පහසුවට පත් කිරිම සාමාජිකයන්ගේ සාමුහික කාර්යයක. බස් රථයක 40 කට පමණ යා හැකියි. බස් රථ දෙකක් වෙන් කරවා ගැනීමට බලාපොරොත්තු වෙනවා. ත්‍රිකුණාමලය විශේෂයෙන්ම දෙස් විදෙස් සංචාරක ආකර්ශනය දිනාගත් ප්‍රදේශයක් බැවින් මිලගණන් ටිකක් වැඩියි. ප්‍රවාහන පහසුකම් ආයතනයෙන් සපයන නිසා එක් අයෙකුගේ අනෙකුත් වියදම් සඳහා පමණක් අය කරනු ලැබේ. පවුලේ සාමාජිකයින් ද කැටුව ගිය හැකි නමුත් මහ බැංකු විශ්‍රාමිකයන් හැර වෙනත් අය සහභාගීවන්නේ නම් ගාස්තුව වෙනස් වන බව ද සලකන්න.

- සංස්කාරක -

# Three Day Trip of the Year.

We have pleasure in informing you that our one day trip of the year held on 11th of august with a considerable participation was both successful and joyful. With the intention of providing you again the opportunity of being together , this time for three days, with your friends and favorites of the bank while in your service there, our three day trip of the year is being organised these days.


As our presence and movements are mostly limited to the western part of the country, this time we intend to make our 3 day trip to Trincomalee, the capital of the eastern side. The three days fixed for it are 7,8 and 9 of February 2014. The committee of the association hopes to do a proper organizing of the trip so as to provide you the best possible travelling comfort, food and drinks, accommodation ans sight seeing. With that in view, we are in need of your cooperation. Please mind that non-delayed decision to join the trip and timely payment of the charges is a great help, in the task of organizing.

We will soon inform the charge per person for joining the trip. After knowing it, if you decide to go, please book your seat or seats by contacting the Assistant secretary, Mr. Amarapala Karasinghe Arachchi through tel no 038-2234226. Partakers of the trip are also kindly requested to make the due payments on or before the final date for payment which is to be made known to you soon.

Members of the pension association are also informed that if their friends and relations go with them on the trip, a higher charge will be collected from them each of such friends and relations than what applies to the members and those of their families.

**- The Secretary -**

# කුමන කුරුළු පරාදීසයේ අසිරිය විඳ ගනිමු.



ශ්‍රී ලංකාවේ වනෝද්‍යාන අතුරෙන් ඉතාමත් සුවිශේෂී වනෝද්‍යානයක් ලෙස කුමන (යාල නැගෙනහිර) ජාතික වනෝද්‍යානය හඳුන්වන්න පුළුවනි. යාල රුහුණු ජාතික වනෝද්‍යානයට සේම කීර්තිමත් දිගු ඉතිහාසයක් හිමි කුමන ජාතික වනෝද්‍යානය කුරුළු රජ දහනකි. මෙය දෙස් විදෙස් සංචාරක පක්ෂීන්ගේ සොඳුරු නවාතැන් පොළක් ලෙසින් ලොව පුරා ඉමහත් ප්‍රසිද්ධියට පත්වී තිබේ. පක්ෂීන්ට ජීවත්වීමට ඉතාම සුදුසු මනරම් පරිසරයක් මෙහි තිබේ.

කුමන ජාතික වනෝද්‍යානය නැරඹීමට කොළඹ සිට පැමිණෙන සංචාරකයින්ට පැමිණිය හැකි මාර්ග දෙකකි. කොළඹ සිට කුමන ජාතික වනෝද්‍යානයට ඇති මුළු දුර කි.මී.391 පමණ වේ.




කොළඹ රත්නපුර මාර්ගයේ පැල්මඩුල්ල-බෙරගල-වැල්ලවාය-මොණරාගල-පොතුවිල් පානම ලෙස එක් මාර්ගයකුත්, කොළඹ රත්නපුර මාර්ගයේ පැල්මඩුල්ල-හිබොල්නාටිය-උඩවලවේ-තනමල්විල-වැල්ලවාය- මොණරාගල-පොතුවිල්-පානම අනෙක් මාර්ගයත් වේ. ජාතික වනෝද්‍යානයට ඇතුල්වීමට ඇත්තේ එක් පිවිසුමක් පමණි. එය පානම කුඩුම්බිගල අභය භූමියේ පිහිටා ඇත. උද්‍යාන කාර්යාලය පිහිටා තිබෙන්නේ මේකන්ද ප්‍රදේශයේය. වනෝද්‍යානයට ඇතුළුවීමට අවසරපත් හා මාර්ගෝපදේශකයකු එහිදී අනිවාර්යයෙන්ම ලබා ගතයුතු වේ. සංචාරකයන්ට වනෝද්‍යානයේ සංචාරය කිරීමට ජීප් රථ අවශ්‍ය වන්නේ නම් පොතුවිල් නගරයෙන් හෝ පානමින් ලබාගත හැකිය. වනෝද්‍යානයේ ගමන් කරන පළපුරුදු ජීප් රථ රියදුරන් මෙම ස්ථානවල සිටියි. සමූහයක් වශයෙන් වෑන් රියකින් හෝ බස් රථයකින් වුවද කුමන වනෝද්‍යානයට ඇතුළුවීමට අවසර ඇත. ඒ සඳහා ගාස්තු වනෝද්‍යාන කාර්යාලයට ගෙවිය යුතුවේ. මෙම වනෝද්‍යාන කාර්යාලයට සමීපව වන සතුන්ගේ කුඩා කෞතුකාගාරයක් ද ඔබට නැරඹීමට පුළුවන.

හෙක්ටයාර් 18,149 ක් පුරා විහිදුනු යාල නැගෙනහිර හෙවත් කුමන වනෝද්‍යානය කලාප 2 කින් යුක්ත වේ. 1 වන කළාපයේ විශාලත්වය හෙක්ටයාර 17,863 ක් වේ. 2 වන කලාපයේ විශාලත්වය හෙක්ටයාර 286ක් වේ. ලොව පුරාම විදෙස් සංචාරක ආකර්ශනය හිමි වූ කුමන විනෝද්‍යානයට ඉමහත් ප්‍රසිද්ධියක් එක් කොට තිබෙන කුමන විල්ලුව හෙක්ටයාර 200-250 ක් අතර ප්‍රමාණයක් දක්වා වනෝද්‍යානය පුරා විහිදී තිබේ. මීටර් 2-6 පමණ ගැඹුරකින් යුත් විල්ලුව කුඹුක්කන් ඔයෙන් හා මහ මුහුදෙන් මායිම් වී ඇත. විල්ලුව අවට කඩොලානින් වැසී ගත් වගුරු බිමේ කිරල, හම්බු හා කැරම් පඳුරු බොහෝ සේ දැකිය හැකිය.

මුහුදු මට්ටමේ පිහිටා තිබෙන මෙම වනෝද්‍යානයේ මීටර 90 පමණ උස් ශෛෂ කඳු පිහිටා ඇත. විල්ලු, වගුරු බිම් හා මහ මුහුදෙන් මායිම් වූ






ජල පෝෂක ප්‍රදේශ, ශේෂ කඳු, ලඳු බිම්, තැනිතලා, ආදියෙන් මෙන්ම වනාන්තරයෙන් ද සැදුම් ලත් කුමන ජාතික වනෝද්‍යානය පුරාම පාහේ ඉතා මනස්කාන්ත පරිසර පද්ධතියක් දැකිය හැකිවේ. එය සොබා දහමට පෙම්බැඳි කාහටත් නෙතට රසඳුනක්ම වේ. මධ්‍යම කඳුකරයේ නැගෙනහිර බෑවුමෙන් ඇරඹෙන කුඹුක්කන් ඔය මොණරාගල දිස්ත්‍රික්කය හරහා පැමිණ රුහුණු ජාතික වනෝද්‍යානය මායිම් කරමින් වනෝද්‍යානයේ තුරුලතා වලට මෙන්ම වන ජීවීන්ට ද ජලය සපයා දෙමින් කුමන වනෝද්‍යානයේදී පරිනත ගංගාවක්සේ සියළු පහත්බිම් ජල පෝෂක ප්‍රදේශ තෙත් කරමින් මුහුදට ගලා බසී. කුඹුක්කන් ඔය අසබඩ කුමන ජාතික වනෝද්‍යානයේ ඉතා දැකුම්කලු පරිසරයක් ස්වභාව ධර්මයා විසින් මවා පා ඇත. නැගෙනහිර පලාතේ අම්පාර දිස්ත්‍රික්කයේ පිහිටි මෙම වනෝද්‍යානය



ජාතික වනෝද්‍යානයක් ලෙස ප්‍රකාශයට පත්කොට තිබෙන්නේ 1969 දොසැම්බර් 26 වැනි දිනයි. එයට දෙවන කලාපය මුලින්ම අයත් වී තිබේ. ඉන් අනතුරුව පළමු කලාපය 1970 ජනවාරි 02 දින ප්‍රකාශයට පත්කොට තිබේ.

වනෝද්‍යානයට ආසන්නයේ පිහිටි කුඩුම්බිගල ආරණ්‍යසේනාසනය බෞද්ධ ජනතාවගේ වැදගත් ආගමික ස්ථානයකි. දැනටත් මෙම ආරණ්‍යසේනාසනයේ භික්ෂුන් වහන්සේලා වැඩ වාසය කරති. විවිධ පලාත් වලින් පැමිණෙන සැදැහැවත් බෞද්ධ ජනතාව එම භික්ෂුන් වහන්සේලාට සිව්පසය ලබා දෙති. ගරා වැටුනු ලෙන්, දාගැබ්, බෞද්ධ නටබුන් හා ප්‍රතිමා වහන්සේලා මෙම ආරණ්‍යසේනාසන භූමියේ තිබී සොයාගෙන ඇත. මෙහි පිහිටා ඇති බඹරගස්තලාව හෙවත් නාගපබ්බත විහාරය මෙන්ම කුඩුම්බිගල තපෝවනයත්, එහි දක්නට ලැබෙන ඓතිහාසික බෞද්ධ නටබුන් හා කටාරම් කොටන ලද ලොකු කුඩා ගල් ලෙන් හා ගල් පොකුණ ආදියෙන් පැහැදිලි වන්නේ අතීතයේ බෞද්ධ පරිසරයක් මෙම ප්‍රදේශයේ තිබී ඇති බවයි.

වසරේ වැඩි කාලයක් වියළි ස්වභාවයක් උසුලන මෙම ප්‍රදේශයට වර්ෂාව ලැබෙන්නේ දෙසැම්බර් හා ජනවාරි මාසවල ඇදහැලෙන ඊසානදිග මෝසම් වර්ෂාව මගිනි. දැඩි වියළි දේශගුණයට ඔරොත්තු දෙන වියළි කලාපයට ආවේණික කටු පඳුරු හා ශාක විවිධත්වයන් මෙහි



දක්නට ඇත. වීර, පලු, මයිල, ඇහැල, බුරුත වැනි තද පොත්ත සහිත ශාක මෙන්ම ජලාශ්‍රිත ප්‍රදේශවල කුඹුක් විශාල වශයෙන් දක්නට ඇත. කුඹුක්කන් ඔයට නම යෙදී ඇත්තේ ද කුඹුක් ශාකයන් විශාල වශයෙන් ඔය දෙපස වගා වී ඇති නිසා විය හැකිය. මේ හැර වගුරු බිම්වල කිරල, කඩොලාන, හම්බු වැනි ශාක ද දැකිය හැකිය.

යාල රුහුණු වනෝද්‍යානයේ මෙන්ම යාල නැගෙනහිර කුමන වනෝද්‍යානයේත් සත්ව විවිධත්වයන් දැකිය හැකිය. නමුත් කුමන වනෝද්‍යානයට දෙස් විදෙස් සංචාරකයන් වැඩි වශයෙන් පැමිණෙන්නේ කුරුල්ලන් දැක බලා ගැනීමටය. මෙය කුරුලු පරාදීසයක් ලෙස ප්‍රකටව ඇත්තේ විවිධ වර්ගයේ කුරුල්ලන් මෙහි සිටින බැවිනි. වසර පුරාම පාහේ මෙහි හොඳ පක්ෂි විවිධත්වයක් දැකිය හැකිය. විශේෂයෙන්ම අගෝස්තු, සැප්තැම්බර් මාසවල මෙහි පවතින උණුසුම් බව හා ආහාර ලබාගැනීමේ හැකියාව හේතුවෙන් විදෙස් සංචාරක පක්ෂීන් ශ්‍රී ලංකාවේ නැගෙනහිර දෙසට පැමිණේ. ලොව නන් දෙසින් පැමිණෙන ජලාශ්‍රිත පක්ෂීන් මෙන්ම වෙනත් විවිධ වර්ගයේ පක්ෂීන් රංචු වශයෙන් කුමන කුරුලු

පරාදීසයට මෙම සමයේදී පැමිණෙන්නේ ඔවුන්ගේ වාසයට ඉතා හිතකර පරිසරයක් මෙහි පවතින බැවිනි.

කුමන විල්ලුව ප්‍රදේශයේදී දැකිය හැකි සංචාරක ජලාශ්‍රිත පක්ෂීන් අතර සියක්කාරයින්, පැස්තුඩුවන්, ඇඹල කොකා, හැදි අලවා, අළු කොකා, කරවැල් කොකා වැනි කොක්කු වර්ග රාශියක් ද මානාවෝ, සේරු, දියකාවෝ, මුහුදු ලිහිණියෝ, අවිච්චියෝ, උකුස්සෝ, වැහි කුරුල්ලෝ වැහි ලිහිණියෝ, සුදු රෙදි හොරා, කුරුලු ගොයා, මොණරා, රාජාලියා ඇතුළු දේශීය මෙන්ම විදේශීය



පක්ෂීන් රාශියක් කුරුලු පරාදීසයේදී දැකගත හැකිය. පක්ෂීන් දැකගැනීමට සුදුසුම කාලය වන්නේ අගෝස්තු සිට මාර්තු දක්වා කාලයයි. දහස් සංඛ්‍යාත කුරුල්ලන්ගෙන් කුමන විල්ලුව පිරී යන්නේ ඉතා මනස්කාන්ත දසුන් මවමින්ය, පක්ෂි ලෝලීන් මෙන්ම සොබා දහමට පෙම්බැඳි සංචාරකයින් බොහෝ දෙනා කුමන ජාතික වනෝද්‍යානය වෙත පැමිණ සොබා දහමේ අපූර්ව චමත්කාරය විඳ දරා ගනිති.

වනෝද්‍යානය ඇතුළත කඳවුරු බිම් රාශියකි. පුද්ගලයන් 8 දෙනෙකුටත් 10 දෙනෙකුටත් ප්‍රමාණවත් කඳවුරු බිම් වනෝද්‍යානය තුළ පිහිටා ඇත. සමහර සංචාරකයන් දින ගණන් මෙම කඳවුරු බිම් වල නැවතී සිට මෙම මනස්කාන්ත දර්ශන ඔවුන්ගේ උප නෙතට ඇතුළුකර ගැනීමට උත්සාහ ගනිති. විල්ලුව ආශ්‍රිත ප්‍රදේශයේ දියබීමට පැමිණෙන වනයේ සද්දන්තයා මෙන්ම අහිංසක සතුන් වන මුවා,ගෝනා, නරියා මෙන්ම කුළුහරකා රංචු වශයෙන් තැනිතලා බිම්වලදී දැකිය හැකිය. තනිව සිටින කුළු හරකා ඉතාමත් චන්ඩ ස්වභාවයක් දක්නට ඇත. එමෙන්ම ජලාශ ආශ්‍රිතව අව් රශ්මිය ලබාගැනීමට ගොඩට පැමිණ සිටින කිඹුලන් විශාල දර කොට මෙන් නොසෙල්වී සිටිනු දැකගන්නට හැකිය. වනෝද්‍යානය සුන්දර කරන මුව



පොව්වන්ගෙන් ද අඩුවක් නැත. එමෙන්ම කුමන සූර්යෝදයේදී පිල් විදහාලමින් රඟන මොනරුන් ද විශාල වශයෙන් ඔබට දැකගැනීමට පුළුවන. මෙම වියළි කලාපයේ ජීවත්වන වල් ඌරා, මී හරකා, දිවියා වැනි ක්ෂීරපායීන් මෙන්ම උරගයින් රාශියකට ද කුමන වනෝද්‍යානය නිවහන වී ඇත.

කුමන ජාතික වනෝද්‍යානය නැරඹීමට යන දේශීය සංචාරකයන්ට අතරමගදී පහත සඳහන් ස්ථාන වලට ද ලඟාවිය හැකිය. උඩවලවේ ජලාශය, බුදුරුවගල, යුදගනාව, දෙමටමල් විහාරය, මාළිගාවිල, මගුල් මහා විහාරය, මුහුදු මහා විහාරය, කුඩුම්බිගල ආරණ්‍ය සේනාසනය ආදිය සඳහන් කළ හැකිය. කුමන සිට අම්පාර දෙසට ගමන් කරන්නේ නම්, හිඟුරාණ සීනි කම්හල, දීඝවාපි චෛත්‍යය, බුද්ධංගල, සේනානායක සමුද්‍රය,



රජගලතැන්න, පියංගල, පුළුතුනාව ආදී ස්ථාන නැරඹීම ද කළ හැකිය. පොතුවිල් නගරයේ මෙන්ම අම්පාර නගරයේ ද සංචාරකයන් සඳහා නැවතීමට සුදුසු සංචාරක නිවහන් දැනට ඉදිකර ඇත. ත්‍රස්තවාදී උවදුර පහව යාමත් සමග දේශීය හා විදේශීය සංචාරකයන් සඳහා කුමන කුරුලු පාරාදීසය හෙවත් කුමන ජාතික වනෝද්‍යානය නැවත විවෘතව පවතී.

**ප්‍රේමදාස ගමගේ**

# අතළඟ 14

හීතල දුරුත්ත ගතට, සිතට, මනසට අරං එන්නෙ අමුතුම අමුතු පණිවුඩයක්. 2012 දීත් මේ හීතල මේ පණිවුඩයම මේ විදියටම ගෙනාව. 2011 දීත් ඒකම එහෙමම වුනා. හැමදාම එහෙමමයි. දැන් 2013 ත් එහෙමමයි. 2012 හීතල දුරුත්තෙ දී 2013 පිළිගත්තෙ චට පට චුස් බූස් ඩොං පටෝරියං ගාල බොහොම සද්දෙට. හරිම උජාරුවෙන්. පල්ලම් බහින 2013 හීතල දුරුත්තෙ පණිවුඩේ අරං එනහැටි මෙන්න. ''අත අරින්න 2013. ඔන්න එනව 2014. ඒකට අත දීල සද්දෙ ඇතුව පිළිගන්න. අදට වැඩිය හෙට හොඳයි. අළුත් 365 ක්. කල් පිරුනු, වයෝවෘද්ධ 2013 පැත්තකට දාල, නව යොවුන් 2014 වැළඳ ගන්න සූදානම් වෙන්න'' ඔන්න ඕක තමයි හීතල දුරුත්ත ඇඟ හිරිගඩු පුප්පමින් ජ්‍යෙෂ්ඨ කණිෂ්ඨ හැමෝටම ගේන පණිවුඩය.

දැන් අනික් ඉලක්කම් වගේම 2013 ත් ඉතිහාසයට යනව. 2014 වර්තමානයට එනව. 2014 ත් පරිනත වෙලා වෘද්ධ වෙනකම් උජාරුවෙන් ඉන්නවා. ඒකටත් ඒ ටිකම තමයි වෙන්නේ. හීතල දුරුත්ත ඊට වඩා ගැඹුරින් කියන දේකුත් තියෙනවා. අපම හදාගත්ත ඉලක්කම් වලින් තුනේ ඉලක්කම වෙනස් වෙලා හතරෙ ඉලක්කම දා ගන්නව. ඒකත් එක්කම 3 ඉලක්ම 4 ඉලක්කම වෙලා අපට කාලයට විකල්පයක් නැති බව මතක් කරනව. ඒ නිසා විශ්‍රාමය හෙවත් විවේකය කියන්නෙ කාලයෙන් නිසි ප්‍රයෝජන ගැනිම බව දුරුත්ත අපට කියල දෙන අගනාම පාඩමයි.

ඒ අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ විශ්‍රාමික සංගමයේ ඔබ සැමට කාර්ය බහුල, සතුට ඉහවහා ගිය සුභ නව වසරක් වේවා !

- සංස්කාරක -

# If Your Claims Delay..........?

Joined the bank as blooming youngsters, devoting for proper duty. Time slipped past us without noticing. Service matured and had to say "Good-Bye"s. With that joined the senior citizen population sector, enjoying retirement.

Central Bank is offering ample duties and responsibilities for the above mentioned. Specially Staff Services Management Department and Secretariat Department are working really close with senior citizens. So If you have any matter regarding your medical benefits or other, please remember to inquire with clearly mentioning your pension number as well as your name. It has come to our knowledge that many medical application claims are getting postponed and re-routed due to missing or unclear ID number, pension number, Telephone number, signature or name. So please do the needful. If you have difficulties, do not hesitate to get someone to assist you for filling up those said information. This would be a great help to pay the claims in due time

-Editor-

# ගෙවීම් ප්‍රමාද නොවන්නට නම්......?

භද්‍ර යොවනයේදි බැංකු සේවාවට එකතු වෙලා සවිබලය නිසිලෙස රාජකාරියටම කැප කළා. නොදැනීම කල්ගත වුනා. කල්පිරුණා. ආයතනයෙන් සමුගත්තා. ඉන් පස්සෙ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ සංඛ්‍යාවට එකතු වුනා. එහෙම වෙලා විශ්‍රාම සුවය සුවසේ විඳිනවා. ඒ සඳහා මහ බැංකුව යුතුකම් හා වගකීම් ගොඩක් විශ්‍රාමිකයන් වෙනුවෙන් සලස්වනව. විශේෂයෙන්ම කාර්ය මණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුවත්, ලේකම් දෙපාර්තමේන්තුවත් ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට ඉතාමත් සමීපයි. මෙහිදී වෛද්‍ය පහසුකම් හෝ එවැනි කාර්යකට සම්බන්ධව හෝ වෙනයම් කටයුත්තක් සඳහා විශ්‍රාමික ඔබ විසින් මහ බැංකුවට ඉදිරිපත් කරනු ලබන ලියකියවිලිවල ඔබේ විශ්‍රාමික අංකය සහ නම පැහැදිලිව සටහන් කරන්න මතක තබා ගන්න. විශේෂයෙන්ම වෛද්‍ය ප්‍රතිලාභ සඳහා ඉදිරිපත් කරන ලද ලියකියවිලිවල අදාල විශ්‍රාමික අංකය, නිවැරදි නම, අත්සන හා දුරකථන අංකය ආදිය පැහැදිලිව හා නියත වශයෙන්ම සඳහන් කරන්න. එහෙම නැති නිසා ගෙවීම් ප්‍රමාද වූ ප්‍රතිලාභ ඉල්ලුම්පත් රාශියක් ඇති බව වාර්තා වෙනව. මේවා ආපසු එවීමට සිදුවීම ද තවත් වැඩක්. ඒ නිසා ඔබට ඔබගේ විශ්‍රාමික අංකය පැහැදිලිව සටහන් කිරීමට අපහසු නම් අන් අයෙකු ලවාවත් සම්පූර්ණ කර යැවීමට මතක තබා ගන්න. ප්‍රතිලාභ ගෙවීම් කටයුතු එතකොට ප්‍රමාද වීමකින් තොරව ඉක්මනින්ම කෙරෙයි.

-සංස්කාරක-

# CENTRAL BANK PENSIONER AND THE BANK

It is no exaggeration to say that every minute resting in the well-earned retirement retreat, after serving for long years in the most prestigious institution of Sri Lanka, the Central Bank, for such a pensioner to still feel that person is not detached from it. The distance that part one from the premises or the removal from fondly cultivated direct association with the other members of the dear staff in addition to the termination of attending to any direct duties do not stand as barriers to relive that life in a pleasant way. If interested, it is possible through the use of marvelous electronic communication devices to maintain prepetual memories and get acquainted with the updated material by contacting the old friends or the friends still in service, thus keeping alight the much required social networking also intact.

The monthly pension slip trnsmitted by the Bank in hand right on time like a prayer symbolizes that harbinger that we are in the lime light. Thanks are due to those officers who devotedly maintain a track of the records of the past collegues and attend to all other welfare details faithfully, at the same time not forgetting to remember us in a personalized note at the dawn of every New Year. Any short comin in not reciprocating should end in commendation of this nature.

In the visits that are paid to the Bank to obtain some service or the other to update information subsequent to retirement, though they are few and far between, the collegues who are still in service amid attending to their duties and responsibilities never fail to exchange some pleasantries and recall the past acquaintances bringing much solace. It is always good and nice that such gestures continue to exist and are carried forward to the future so that it could bring about the same satisfaction when the current staff and those to follow too enjoy such treatment when they reach their age of retirement. And this is one important way to uphold and spread the good reputation of our Institution. Concerns, nevertheless have been expressed in some instances, by certain quarters that unfriendly treatment were meted out but that if at all happened could have occurred due to human frailty and deserve to be completely ignored. In the context of making matters easy and smooth, in certain circles question is raised why in this electronic age the Central Bank

# CENTRAL BANK PENSIONER AND THE BANK

It is no exaggeration to say that every minute resting in the well-earned retirement retreat, after serving for long years in the most prestigious institution of Sri Lanka, the Central Bank, for such a pensioner to still feel that person is not detached from it. The distance that part one from the premises or the removal from fondly cultivated direct association with the other members of the dear staff in addition to the termination of attending to any direct duties do not stand as barriers to relive that life in a pleasant way. If interested, it is possible through the use of marvelous electronic communication devices to maintain prepetual memories and get acquainted with the updated material by contacting the old friends or the friends still in service, thus keeping alight the much required social networking also intact.

The monthly pension slip trnsmitted by the Bank in hand right on time like a prayer symbolizes that harbinger that we are in the lime light. Thanks are due to those officers who devotedly maintain a track of the records of the past collegues and attend to all other welfare details faithfully, at the same time not forgetting to remember us in a personalized note at the dawn of every New Year. Any short comin in not reciprocating should end in commendation of this nature.

In the visits that are paid to the Bank to obtain some service or the other to update information subsequent to retirement, though they are few and far between, the collegues who are still in service amid attending to their duties and responsibilities never fail to exchange some pleasantries and recall the past acquaintances bringing much solace. It is always good and nice that such gestures continue to exist and are carried forward to the future so that it could bring about the same satisfaction when the current staff and those to follow too enjoy such treatment when they reach their age of retirement. And this is one important way to uphold and spread the good reputation of our Institution. Concerns, nevertheless have been expressed in some instances, by certain quarters that unfriendly treatment were meted out but that if at all happened could have occurred due to human frailty and deserve to be completely ignored. In the context of making matters easy and smooth, in certain circles question is raised why in this electronic age the Central Bank

is still inactive and slow to introduce electronic verification and correspondence thereby save time, money and energy. Continuation of sending letters through the post does not augur well for the Bank's standing in the current atomosphere. It is also some what a reason for shame and lamentation that retirees are required to sign their live certificates in front of some approved personnel and file in hard copy to the Bank, whereas a start for digital authentication could be implemented instead.

Every pensioner, naturally harbor the hope the rest of their precious lives continue to be spent in the spirit of cordial relations with the present set up and be in touch with the latest developments affecting all-round. As such generally among friends, exchange of information about whatever relevant details there happen to be worthy of relay and the parting of the pertinent kind of information about each other as available, usually take place through the use of modern communication techniques that are easily reachable today. The use of the internet in this context is wonderful. Such interactions bring about useful results and inspirational warm up in the hearts which otherwise at times could degenerate to low levels and cause loneliness and despair. For the more adventurous such opportunities could well be utilized to further their knowledge base by getting in touch with the number of intellectual role model characters who are many among us.

We are aware that many off spring of most of our friends have by now reached important positions in the society which is an extremely heartening development. Also examples of such children, after realizing the connections of their parents in the form of working in the same trade but now live in retirement, coming forward unhesitatingly to render unsolicited helping hand in times of need when such help is much required are not rare. So, one must be friendly, active and resourceful enough to be abreast in such situations.

The 'Sandawa' issue is in the fore-front to update and pass on to us useful information in respect of relevant official developments as well as highlighting nostalgic memories pretaining to our past in well documented articles, old photographs etc. published in it. that process is helpful to rekindle the waning spirits and uplift the receding moral. Finally, when the news of demises relating to those robust, kicking and lovely characters who stoically blossomed among us just a few years ago, are brought so sadly to our notice, that clearly remind the necessity to groom a deposition to face our inevitable destiny, end of this mission so successfully accomplished, with a cheerful smile.

**- Henry Manawadu -**
**Canada**



## පන්නරය ලබනයු'රු අප දුටුවේ නුඹගෙන්

තුඟු රන හඬින් නගා ජය ගොස
පහර පිට පහර දී අයුක්තියටම
පෙනී සිටියේ අප වෙනුවෙන්ම නුඹ !!

දැහැටි දඬු මෙන් හපා විසිකර
පෙළන විට පාලකයන් අපව
මුහුණට මුහුණ දී නොපැකිල
අසනි සැරයක් විලසින් නැගී
සැනෙකින් පහර දෙන්නට
කියා දුන්නේ නුඹ !!

නොදත් දේ අප හොඳින්
කියා දී පැහැදිලි බසින්
ඥාණ ලෝකය වෙමින් අප හට
පෙර මග එළිය කළ
රතු තරුව නුඹ !!

කුඩා සිරුර තුළ පිරිපුන්ව
සැඟවුන ජව ගුණය සටන්කාමී
යෝධ ශක්තිය වුනා නෙකවර
දිනන්නට පැරදෙන සටන්
ජය කොඩිය ඉසිලූ
සෙබලියයි නුඹ පෙරමග ඉඳන් !!

දුටු සඳ අයුක්තිය ඒ දුටු තැනම ගැටී
යුක්තියේ ගිනි පුපුරු නංවා
කිණිහිර මතම දිලී
හරි දැක්මෙන් දරා ජයකොඩිය අත යලි යලි
ලද පන්නරය කිසි දිනකදී නොයයි ගෙවී ·!!

තිබියදී දහසකුත් වැඩ
පිලිගන්වා අසුන ආගිය බොහෝ විට
විමසා වත්මනේ දිවි මග රුව වරුණ
නිවැරදිව මග කියා දුන්
ලබැඳි සෙහොයුරිය නුඹ !!

අසාධාරණයට එරෙහි වන්නට
යුක්තිය වෙනුවෙන් පෙනී සිටින්නට
හරි මග කියා දුන්
සොයුරු දහමේ සෙත් කවිය නුඹ !!



ජගත් කාරියවසම්
038 - 2236643

(සංවේදී මුදු හදින් යුතුවම නිරන්තරේ විශ්‍රාමිකයන් කෙරේ දයා ඇස යොමු කළ **ඥාණා රණතුංග** සොයුරිය මහබැංකු සේවාවෙන් විශ්‍රාම යාම නිමිත්තෙනි.)

## සමුදීම

කන්දක් උඩට වී තරු ගැන ගැන        උන්න
වැලකුත් නැතිව ගිය කාලෙක        පැටලෙන්න
කොම්පියුටරය ආ හින්දම ජොබ්        දෙන්න
පින පැදුනා අපෙ මහ ගෙදරට        එන්න

ගම්බද නැතිව හිත ඇති ගැලපෙන        තාලේ
පෙළපොත් කළේ ඉතිහාසේ        භූගෝලේ
වැඩ කළ තැනට ලොකුවට බැඳ ගෙන        ආලේ
ආයෙත් ගියා මුල ඉඳලම        ඉස්කෝලේ

ගැටවර වියේ තිබුණා හොඳහැටි        ගැම්ම
පොත පත වැඩ කළා ඇස් රතු        වෙනකම්ම
වෙර වීරියෙන් පැන්නම වැදගත්        පිම්ම
යුගයක් වුණා දස්කම් බිල්ලට        දැම්ම

නියමය පරිදි තැබුවත් වැටුපෙන්        උස්සා
ටික දිනකින්ම ඒකට හැඩුවනෙ        බස්සා
ගැලපුම් කරනවායි කළ අවුලෙන්        ලිස්සා
ඉහළින් ඉඳන් යළි හිටි තැනටම        බැස්සා

වග කිව යුත්තො ටික කරබාගෙන        ඉද්දී
කළ ආයාචනා කුණු කුඩෙට        යද්දී
පන්දම් ඇල්ලූ අය ලොකු පුටුවට        එද්දී
එක එක තෙරපුණා සිත් රිදවන        සිද්දී

උරුමය වෙලා එක තැන පල්වෙනා        දොස
කොට ගිනි සැරෙන් තව විරසක වුනා        හිස
වයසට පෙරම හිතුනේ සමුදෙනා        ලෙස
මිට මොළවන්න නොව හද පෑරුණා        මිස



ජේමදාස අතාවුද

පැදි විදි

## සාලිය අශෝක මාලා

අශෝක මල් වනය සිරියෙන් සිත් ගනිය
ලියකිය වනේ මල් නෙලමින් පිය මැනිය
රූපෙන් බැබලි ඇය එහි වන ලිය වැනිය
ඇය මල් නෙලන උදයේ බොහො විට පිණිය

මල් නෙක නෙලා තැනුවේ ඇය මල් මාලා
පියුමක සුමුදු බව ගත් ඇගෙ නම මාලා
බවයක පෙර ද මෙලෙසම මල් පළ ඥාලා
විය හැක ඇයට දෙවියෝ රූපය දීලා

සුපුරුදු ලෙසින වනයේ මල් නෙලු දිනක
තරුණෙකි පැමිණි තෙදයෙන් නැග අසු පිටක
ඔහු විත් ඇදී ඇගෙ ළඟ නතරව සැනෙක
ඇය දෙස බලා උන්නෙය වශී වූ ලෙසක

මිදී කුල්මතින් කට හඬ අවදි කර
ඇසී ඇයගෙ විස්තර දැනගන්න යුර
අශෝක මාලා ඇගෙ නම කී එවර
දුනී හැඳින ඔහු බව සාලිය කුමර

ලස්සන මලට ඉගිලෙන සමනළය ලෙස
දිස්විය කුමරු ඇදි යනු ඇය සිටින දෙස
හිස්විය ඔහුට මාලිගෙ ඇය නොගැටී ඇස
උස් රජ සිරිද පැරදිය පෙම් දමක රස



එන්නේ ඇයි ද මෙලෙසට මා හමු වන්න
සන්තාපයෙන් වුව සිත මුව සමු ගන්න
පින්නෑ මෙමට කුමරුනි ඔබෙ අත ගන්න
චණ්ඩා ලියක් වන මා අත හැර යන්න

මාලා නුඹට පෙම් කළෙ මම නොදැන නොවේ
පාවා ගැන්ම ඔබ මගෙ එක සැපත සුවේ
ප්‍රේමා දරිය ඔබ අභිමිව සුපෙම් ලොවේ
නෑමා පතන්නේ කිරුළද ලක් පො ලවේ

මට හිමි කිරුළ තිර ප්‍රේමෙට පිදු නාසේ
වැට හෙයි ලොවට ඇති බල පෙම් අනු භාසේ
පැට ලුන පෙමෙහි සාලිය මාලා වාසේ
පට බැඳ කියවේ සැමදා ලක් ඉති භාසේ



W.D.A. Raymond -
0112 231357

---

පැදි විදි

## දිවියට අරුතක්

සියළු සතුන් ඇතුළුව මුළු ලොවක් සැදෙයි
සැපත් වීම සහ නික්මුම නිති සිදුවෙයි
නොගොසින් ඒම හෝ නෑවිත් යනු බැරිවෙයි
කිසි දින ලොවෙහි නොවෙනස් වන දහම එයයි

මෝහෙන් මුලා වූ විට සබැඳනි ඔළුව
සතුට වින්දනය කිසි විට ළං නොමව
ඉසි කෝ මාන සිත නිබඳව රජ කෙරුව
අවසන වන්නෙ තමනට තමනුත් නැතුව

ඉවසන ගුණය අන් හැම දෙයටම වැඩිය
වටිනා බවට පවතින අදහස පොදුය
ඕනෑ දෙයක් වන තෙක් නිහඬව සිටිය
එම අදහස නොවේ ඉවසීමේ ගුණය

ලෝකය ඉතා පියකරු බව සිතුවාට
දිව රෑ වෙහෙසෙමින් ලුහු බැඳ දිව්වාට
සිතුවිලි තුළින් නෙක සිතුවම් මැව්වාට
කෙළවර නොදැන යන ගමනක් සැමදාට

ඒ. ජේ. ආර්. විමලා ධනපාල
011 2970561

පැදි විදි

## අධිපති තුමනි !

ජාතික ඇඳුම ඔසරිය කණපාට වෙලා
මුළු කොණ්ඩයෙම සුදුපාටත් අවර වෙලා
ගිනියම් පාරමැද කුඩයට වසන් වෙලා
විශ්‍රාමික අපට ඇයි හෙනහුරු ලබලා

තනිනොතනියට කිසිවෙකු ලඟ නෑ ඉන්නේ
ඉගෙනුම ලබන දරුවන් ඇත බඩ ගින්නේ
ඇඳුමට තිබෙන එක ඇඳුමෙනි සැර යෙන්නේ
යන්තම් ඉගෙන ගත්තොත් ගොඩ යාගන්නේ

එහෙමයි එදා කීවේ අපෙ දෙමව්පියෝ
නැතිබැරි කම එදත් අපෙ ඉහවහා ගියෝ
දුක් කම්කටොළු මැද ඉගෙනුම කරන් ගියෝ
පෙර වාසනාවට බැංකුව තුළට ගියෝ

විසිපස් වසර තිස්පහ එක දිගට කළා
ගෙන ආ නිති රෙගුලාසිත් උච්ච කළා
කාලය තරුණ කාරිය නිසි ලෙසට කළා
එල නැති විටදි ගහ අතහැර මගට කළා

විශ්‍රාමික අපට අය වැය කොයි වේද
සොච්චම් වැටුප් වැඩිවීමක් වත් වේද
කළ සේවයට කළගුණ සලකනු නේද
අධිපතිතුමනි, ඔබ මෙය බලනව නේද?

ඒ.ඩී. විජේරත්න

පිළියන්දල - වි.අංක 3391

පැදි විදි

## එකම ලේ

ඇසෙන් කඳුළු ගෙන
මුව 'ග සිනා රැළි මුළුගැන්නී
නොපහන් සිත ළඟ
නොපනත් කළුවර
ගෙනැවිත් දොර දොර උළලේනි

බිම් කඩක
කටු කම්බියෙන් වැට
පිළෙන් පිළ මුර කාවලුන්
තනා හිර කුටි
එහි ම හිරවී
ගිනියමින් අවි අත දරන්

වම දකුණ ලෙද
අත් දෙකක් ව ද
උපන් දා සිට නැත බිඳී
යවට සේ රත්
ගිනි වැදුණු සිත්
නිවන්නට වෑයම මදී

අන් සතුන් ළඟ නොමැති මායිම්
බෙදා ගත්තේ මනු සතුන්
අපේ මව්බිම පෘථිවියම බව
නොතේරේ අඳ අවි බලෙන්

නිවෙන තුරු ගිනි තබා ඇත්තේ
අදක ඊයෙක සිට නොවේ
ලොවම ගිනිලන අවි හදද්දී
කාටවත් මව්බිම් කොහේ



අමරපාල කරසිංහ ආරච්චි.




පැදි විදි

## THE STABLE

A man of older age by nature discreet
His fair wife tender and sweet
from the country of Nazarath they hail
come on a duty they couldn't fail
all the way to Bethlehem city.
Being present for the census their duty.

Mary the lady submissive winsome
Expectant and to her due days come
Tired wanting a rest at night .
The apir faced a problem tight
early or rich of the census crowd
held all accomodations humble and proud

Finding for them no place suitable
but the ofer of a backyard stable
to ease their bodies and mental bother.
Sadly stepped the couple thither
the stable that turned to be
where was born the king of Kings was he.

W.D.A.Raymond.

පැදි විදි

## ගසක ආයාචනය

මෙතැනින් පියමං කරන කවරෙකු හෝ
මට එදිරිව සුරත ඔසවත් නම්
මට හිංසා කිරීමට පෙර
මෙයට සවන් දෙත්වා

මම,
ශීත අඳුරු රාත්‍රී වල ඔබේ ගිණිඋඳුනේ උණුසුම වෙමි
ගිනි අව්වට වියනක් සේ මිත්‍රශීලී සෙවණ සදන්නෙමි
ඔබ යනෙනා විට පවස නිවන මිහිරි එලවලින්
ඔබ සතපවන්නෙමි

මම,
ඔබ නිවහනේ පියස දරා සිටින යට ලීයද
ඔබේ මේසයේ එලකයද
ඔබ සුව පහසු ලෙස වැතිර සිටින සයනයද
ඔබ සාදන ඔරුවේ දැවයද වෙමි

මම,
ඔබ සීසානා නගුලේ නිමුන් මිටද
ඔබගේ නිවස්නයේ ද්වාරයද
ඔබ නැළවුනු තොටිල්ලේ සහ
ඔබ අවසන් ගමන් යන දෙනෙහි
ආවරණයද වෙමි

මම,
දයාවේ ජීවනයද සුන්දරත්යේ පුෂ්පයද වෙමි
මෙතැනින් පියමං කරන්නෝ මගේ ආයාචනයට
සවන්දෙත්වා - මට හිංසා නොකරත්වා

(නුවරඑළිය බාලදක්‍ෂ කඳවුරේ -
''පෙඩ්‍රෝ කැම්ප් '' හි සිහිවටනයකින්)

-බර්නි ප්‍රනාන්දු-

පැදි විදි

## A Tree Speaks

Ye who pass by and would
raise your hand against me
hearken ere you harm me

I am the heat of your hearth
In the cold dark nights
the friendly shades screening you
from the scorching sun
and my fruits are refreshing draughts
quenching your thirst
as you journey on


I am the beam that holds your house
the board of your table
the bed on which you lie
the timber that builds your boat

I am the handle of your hoe
the door of your home stead
the wood of your cradle
the shell of your coffin

I am the bread of kindness
and the flower of beauty
Ye who pass by, listen to my prayer
Harm me not

(From a plaque in the " Pedro Scout Camp" in Nuwara Eliya)

**Sent By Berney Fernando**



කෙටි කථාව

# බිරිඳගේ පාඩම

**සූ**ටින් කුලීවැඩ කරමින් එදිනෙදා වියදම සොයාගෙන ජීවත් වූ දුප්පත් මිනිසෙකි. ඔහුගේ බිරිඳගේ නම එමලින්ය. ඔවුන්ට තුන් හැවිරිදි සුරතල් පුතෙක් ද සිටියේය. සූටින් දිනපතාම සැන්දෑවට මත්පැන් බී ගෙදර පැමිණ සිය බිරිඳ සමඟ සංඩු කළේය. ඇතැම් දිනයන්හිදී ඔහු ඇයට පහර දුන්නේය. එසේ පහරදීම් වලට ලක් වූ සෑම දිනකදීම, ඈ තම දෙමාපියන් ළඟට යන බව කියමින් බොරුවට තර්ජනය කළාය. කෙතරම් තර්ජනය කළත්, ඇය එසේ නොයන බව තරයේම විශ්වාස කළ ඔහු, ඇයගේ තර්ජන නොතකා දිනපතාම බීමත්ව පැමිණ ඇයට බැණ වැදුනේය. පහර දුන්නේය. එවැනි එක් දිනකදි අතින් ගැසූ පහරක් ඇයගේ කටේ වැදී දතකින් ලේ ගලන්නට විය.

"මේ මිනිහට මේ පාර නං මම හොඳ පාඩමක් උගන්වනව. එක්කො මිනිහ හැදෙයි නැත්තං නැතිවෙයි. ළමයව මං අරන් ගියොත් මිනිහට නිදහස වැඩිවෙලා තවත් බොන්න පටන් ගනී. ඒක හින්ද මං ළමයව දාල හෙට උදේ රැයින්ම අම්මලගෙ ගෙදර යනව. කරගන්න හැටි බලන්න බැරියැ" යි ඈ තීරණය කළාය.

ඈ එවෙලේම තම ඇඳුම් ටික මල්ලකට දමා දොර අසලින් තැබුවාය. පසු දින අළුයම, ඈ තමන් නිදාගත් පැදුරත් එසේම තිබියදී, සැතපුමක් පමණ දුරින් පිහිටි තම පියාගේ ගෙදරට ගියාය.

"මොකද දුවේ මේ එළිවෙන කොටම ? යි ඇයගේ මව ප්‍රශ්න කළාය."

"ඒ මිනිහත් එක්ක ඉන්න බෑ අම්මෙ, මට හැමදාම ගහනවා. බොරු වැරදි අරන් මට සැරදානව. හැන්දෑවට හොඳටම බී ගෙනයි ගෙදර එන්නෙ. මේ බලන්න ඊයෙ හැන්දෑවෙ මට ගහපු පාර. දතකුත් හෙලවෙනව" යි ඈ කීවාය.

"අපොයි කම්මුලත් ඉදිමිලා නේද ?" යි ඇයගේ මව ඇසුවාය.

"අපට උඹව වැඩි නෑ දුවේ, උඹ මෙහෙ හිටපන්" යි ඇයගේ පියා කීවේය.

"ඒ වුනාට තාත්තෙ පොඩි එකා ගැන මට හරිම දුකයි. එයත් එක්ක කරගන්න හැටි බලන්න මං එයාව දාල නොකියම ආව. මිනිහ හොඳ පාඩමක් ඉගෙන ගනී මෙදා සැරේ නං." යි ඈ කීවාය.

මේ අතර සූටින් සුපුරුදු වෙලාවට අවදි වී, තමන් නිදා සිටි ඇඳ ළඟට, එමලින් තේ කෝප්පය ගෙන එන තෙක් බලා සිට, එය නොලැබෙන බව දැක ඇය සොයා කුස්සියට ගියේය. ඔහු සෑම තැනම සෙව්වත් ඔහුට ඇය සොයා ගත නොහැකි විය. ඇයගේ ඇඳුම් ටිකද, ඇය භාවිතා කරන පන් මල්ලද, නැති බව දැන ගත් ඔහු, ඇය ඒකාන්තයෙන්ම ඇයගේ දෙමාපියන් ළඟට යන්නට ඇතැයි සිතුවේය.

"හ්ම් මෙදා සැරේ එහෙනං ඥාති ගෙදර ගිහින්. මෙදා සැරේ තමයි මම උන්දැට හොඳ පාඩමක් උගන්නන්නෙ. හ්ම් එයා හිතනව ඇති මට රස්සාවත් කරගෙන, ගෙදර වැඩත් කරගෙන, ළමයවත් බලාගෙන ඉන්න බැහැයි කියල. එයා දන්නෙ නෑ මේ සූටිය කවුද කියල" යි ඔහු සිතුවේය.

මොහොතකින් දරුවා අවදි වී කිරි ඉල්ලා අඬන්නට පටන් ගත්තේය.

"හිටපන් පුතේ මං කිරි හදල දෙන්නං" යි ඔහු කීවේය.

"තාත්තෙ කෝ අම්ම මට කිරි ඕනැ".

සූටින් වහා වතුර මුට්ටිය ලිප තබා, ඔහුට කිරි තේ කෝප්පයක් සාදා දුන්නේය. ඔහු එය ප්‍රතික්ෂේප කරමින් සුදු කිරිම ඉල්ලමින් ඇඬුවේය.

"සුදු කිරි ? මොනවද ඒ ? ඕක බීපන් පුතේ. ඔය කිරි තේ. මේ මාත් බොන්නෙ ඕවම තමයි" යි ඔහු කීවේය.

"මට එපා. කෝ අම්ම ? මට අම්ම ඕනැ. මට බඩ ගිනියි." යි කියමින් ඔහු අඬන්නට පටන් ගත්තේය.

"අම්ම ආච්චිලගෙ ගෙදර ගියා. දවල්ට එයි. මං ඉක්මනට බත් උයල පොල් සම්බෝලයක් හදල දෙන්නංකො. අඬන්නේ නැතුව ඉන්න." යි සූටින් කීවේය. ඉන්පසු ඔහු යලිත් ලිප ගිනි මොලවා, හාල් හුණ්ඩුවක් ගරා, එය කුඩා මුට්ටියකට දමා ලිප උඩ තැබුවේය. ඉන්පසු ඔහු පොල් ගාන්නට පටන් ගත්තේය. ඒ වෙන විට ලිපේ ගින්දර සම්පූර්ණයෙන්ම නිවී තිබුණේය. එම මුට්ටියේ අඩිය හිල් වී, එයින් වතුර ලිපට වැටී, එහි ගින්දර නිවී ඇති බව දැන ගත් ඔහු. එම හාල් ටික වෙනත් මුට්ටියකට දමා යලිත් එය ලිප තැබුවේය. ඔහු

හිල් වී තිබුණ මුට්ටිය ගෙන, කෝප්පයෙන් එය මිදුලට විසි කළේය.

"හ්ම් මේ ගෑනිගෙ කෙහෙල්මල් මුට්ටිය. මොන එකකට මේව ගෙයි තියාගෙන ඉන්නවද මේ ගෑනි" යි කියමින් ඔහු යළිත් පොල් ගාන්නට පටන් ගත්තේය. මොහොතකින් ගෙයි ඉස්සරහ පැත්තෙක් බල්ලා බුරන ශබ්දයක් ඇසී, පොල් ගෑම නවතා, "පුතේ ඕක බලා ගනිං පූසට හොම්බ දාන්න දෙන්න එපා මැටි කෝප්පපෙට" යි කියමින්, පොල් මැටිකෝප්පය බලා ගැනීමේ කාර්‍යය පොඩි දරුවාට පවරා, ඔහු ගෙයි ඉස්සරහ පැත්තට ගියේය.

කුලී වැඩක් බාර දීම සඳහා, ගමේ ප්‍රභූවරයෙක් ඔහු සොයා පැමිණ සිටියේය.

"නැන්දම්ම සනීප නැතුව පවුල ගෙදර ගිහින් එන්න ගියා මහත්තයා. එයා ආපු හැටියෙම මං එනව. වරද්දන්නෙ නෑ" යි කියමින් ඔහු පිටත්කර යවා යළිත් සූටින් කුස්සියට ගියේය.

ඔහු කුස්සියට යන විට, ඒ පොඩි දරුවා මැටිකෝප්පය පිරෙන්න තරමට වතුර දමා, පොල් ටික දෑතින් මිරිකමින් සිටියේය.

"තාත්තෙ මං පොල් 'මිරිකුව' යි ඔහු මහත් හපන් කමක් කළාක් මෙන් මහත් ආඩම්බරයෙන් කීවේය.

"අපොයි අපොයි උඹ මේ මොකක් කෙරුවද ? දැන් ඉතින් සම්බෝලෙ හදන්නෙ කොහොමද ? මං උඹට කියල ගියේ පූසට කන්න නොදී බලාගන්න කියල නෙ." ය කියමින් සූටින් එම පොල් ටික මිදුලට හලා යළිත් පොල් ගාන්නට පටන් ගත්තේය.

පොඩි දරුවා සූටින්ගේ දෝෂාරෝපනයට ලක්වීම නිසා, කෝප්පයෙන්, ඇඟිල්ලක් කටේ දමාගෙන, සුළු වේලාවක් පසෙකට වී සිටගෙන සිටියේය. ඉන්පසු ඔහු එක වරම එතනින් ගෙයි ඉස්සරහ පැත්තට දුවගෙන ගියේය.

"ඔය කොහේද දුවන්නෙ ? මට පේන හරියෙන් හිටපන් පුතේ. ළිඳ දිහාවට හෙම යන්න එපා." යි සූටින් ශබ්ද නගමින් කීවත්, එය ගණන් නොගෙන, ඔහු ගෙයි ඉස්සරහ පැත්තට දුවගෙන ගියේය. එවිටම බත් හැළිය උතුරා ගොස් ලිප නිවී තිබෙනු දැක, ඔහු එය යළිත් අවුලවා, පොල්කටු දෙකක් ලිපට දමා, පොඩි දරුවා සෙවීම පිණිස ගෙයි ඉස්සරහ පැත්තට ගියේය.

"පුතේ උඹ කොහේද ? කතාකරපන්. අම්මප මේ ළමයා කොහේ ගියාද ?" යි කියමින් ඔහු ළිඳ ඇතුලේද බැලුවේය. එසේ විනාඩි පහක පමණ කාලයක් සෙවීමෙන් පසු, ඔහු ඇඳ යට සැඟවී සිට එළියට ආවේය.

"උඹත් එක්ක නං කිසිම වැඩක් කරගන්න බෑ. උඹව හදල තියෙන හැටි මේ ගෑනි" යි කියමින් සූටින් තම බිරිඳට ද දොස් නගමින් දරුවාගේ උරඉසට සෙමෙන් පහරක් ගසා, ඔහු අතින් ඇදගෙන කුස්සියට ඇවිත් බලන විට බත් හැලියේ වතුර සිඳී, එය ආහාරයට ගත නොහැකි තරමට රොස් වී තිබින.
"අද කන්න හම්බ වෙන්නෙ නෑ. බඩගින්නෙ හිටපන් කාලකණ්ණියා" යි කියමින් යළිත් ඔහුගේ උරඉසට පහරක් ගැසුවේය.

"මට අම්ම ඕනැ. මට බඩගිනි" යි කියමින් පොඩි දරුවා නොනවත්වාම වේගයෙන් අඬන්නට පටන් ගත්තේය. සූටින් ඔහු නැලවීමට කෙතරම් උත්සාහ ගත්තද, එය අසාර්ථක විය. ඉන්පසු සූටින් ඔහු වඩාගත්තේය.

"පුතේ මම කඩෙන් බනිස් එකක් අරන් දෙන්නං අඬන්න එපා" යි සූටින් කීවේය.

ඉන්පසු ඔහු ඇඬීම අඩු කලේය. ඔහු කඩයට ගියත් ඒ වෙන විට බනිස් විකිනී අවසාන වී තිබුණේය.

"පුතේ බනිස් ඉවරයි. මම පාන් බාගයක් ම අරන් දෙන්නං. අඬන්න එපා" යි සූටින් කීවේය.

පහරකෑමට ලක්වී සිටි දරුවා කෝපයෙන් බනිස්ම ඉල්ලා වේගයෙන් අඬන්නට පටන් ගත්තේය.

"මට බනිස් ඕනෑ. මට අම්ම ඕනෑ, මට ගෑනුවා" යි කියමින් ඔහු යළිත් වේගයෙන් අඬන්නට පටන් ගත්තේය.

"අපි යමු පුතේ ආච්චිලාගෙ ගෙදර, අපි එහෙ ගිහින් අම්මව එක්කරගෙන එමු" යි කී පසු ඔහුගේ ඇඬීම නැවතිනි.

ඔහු වහා දරුවාද වඩාගෙන තම බිරිඳ කැන්දන් ඒම සඳහා පාරට බැස්සේය.

"අනේ අම්මප මේ ගෑනිට මල් තියල වඳින්න ඕනෑ.

(18 වැනි පිටුවට)



## Time for Jokes

| | |
|---|---|
| Jim | Hi,Mum,is dinner ready ? I'm starving |
| Jim's Mother | No, Dinners's only half cooked |
| Jim | That's alright - I'll eat the half that's cooked and leave the rest till later |

---

| | |
|---|---|
| Surgeon's wife | Why have you cut the back of this book ? |
| Surgeon | Well, it was marked "appendix"and I cut it out without thinking |

---

| | |
|---|---|
| Bill | The club I'm taking you to tonight is very exclusive, you know |
| Jill | Is that right ? |
| Bill | Yes even the hot dogs are registered at the Kennel Club |

---

| | |
|---|---|
| Father OW! | I'm worried about our son |
| Mother OW! | Why ? |
| Father OW! | He doesn't give a hoot about anything |

---

| | |
|---|---|
| Lady at Zoo | Oh look, aren't those tiny lion cubs sweet ? I wonder what they'd say if they could talk? |
| Zoo Keeper | I think they'd probably say "We're tiger, not Lions !" |

---

Matale Old Thomian's get together Magazine 1995

## Who is he ..........?

Convesation between two ladies.

" When my husband's working , he leaves everyone open - mouthed. "

" Really ..........? what does he do ..........?

" He is a dentist ........."

## " Bank Talk ......."

One of our Bank customers writing to ask for temporary financial assistance, delighted us with his final sentences . " if you can see your way clear to giving me an overdraft, I shall be forever in your debt".

## Out of the World .....!

3 Drunk guys entered a taxi.

The taxi driver knew that they were deadly drunk; so he started the engine and turned off again after about 10-15 seconds, and he told them, " We have reached ....."

The 1st guy suddenly gave him money , and 2nd guy said " thank you.... ". the 3rd guy gave the driver a slap.

The driver was shocked; thinking the 3rd drunk knew what he did. But he asked " What that for... ?

The 3rd guy replied.

" CONTROLL YOUR SPEED NEXT TIME. you nearly killd us ........... ! "

**(From: INTERNET)**
**Gamini Chandrsena**
**(011 - 2963518)**






## බුද්ධ පූජාවනෙ ..........?

එදා මහ බැංකුවේ සේවය කරද්දී අපට ගම් පළාතේ තිබුනේ හොඳ පිළි ගැනීමකි. අවුරුදු උත්සව, මඟුල් මේස, දන්සැල් ආදී විවෘත කිරීම් හැම එකකටම අපට ආරාධනා ලැබුණි.

පළාතේ පොසොන් පෝය දිනක පළතුරු බීම දන්සැලක් විවෘත කිරීමට මට ද ආරාධනයක් ලැබුණි. නියමිත දින නියමිත වේලාවට අදාල ස්ථානයට ගියෙමි. රතිඤ්ඤ හඬින් සහ ශබ්දවිකාශන හඬින් පළාතම දෙවනත් විය. මම ද මහත් උජාරුවෙන් දන්සැලට ඇතුළු වුනෙමි. සංවිධායක මහතා බුලත් හුරුල්ලක් දී මාව පිළිගෙන අසල අසුනක වාඩි වන ලෙස ඉල්ලා සිටියේය. ටික වේලාවකින් සංවිධායක මහතා ම පළතුරු බීම වීදුරුවක් සහ වතුර වීදුරුවක් බන්දේසියක තබා මට පිළිගැන්වීය. මම ද හනික වතුර වීදුරුවෙන් කට සෝදා බීම වීදුරුව එක හුස්මට බීගෙන බීගෙන ගියෙමි. මෙය දුටු සංවිධායක මහතා කිසියම් අපහසුවකට පත් වී ''හරි වැඩේනෙ මහත්තයා ඒ බුද්ධ පූජාවනේ '' කීවේ රහසින් මෙනි. මට දෙයියන් සිහි විය. අතේ තිබූ කවරය ඔහුට දී හනි හනිකට ගෙදර විත් සිදු වූ දේ බිරිඳටවත් නොකියා නිදා ගතිමි.

## වචන ටැපලීම

කරුණාවට රත්නයක් වූ අපේ සහෝදරයෙකු විසින් ම අපට පවසන ලද රසවත් සිද්ධියකි. රාජකාරිය නිමවා නිවස බලා යාමට කොටුව දුම්රියපළට පැමිණ ඔහු දුම්රිය පැමිණෙන තුරු වේදිකාවේ බංකුවක් මත වාඩි වී සිටින අතර එම අසුනේම විදේශික සුදු මහතෙක් දුම් වැටියකින් සප්පායම් වන අයුරු අපේ සහෝදරයාගේ නෙත ගැටී ඇත. ඔහුට ද දුම්වැටියක් ඉරීමේ ආශාවක් ඇති වූ බැවින් අසල තිබූ කැන්ටිමෙන් දුම් වැටියක් මිළදී ගෙන ඉහත කී සුදු මහතා අසලින් ම වාඩි විය. දුම්වැටිය දැල්වීමට ඔහු අත ගිණි පෙට්ටියක් නොවූ බැවින්, සුදු මහතා අමතා '' කැන් යූ ගිව් මී ද මැක්ස් ඔෆ් බොවස් '' යනුවෙන් පවසා ඇත. සුදු මහතා ද කට කොනකින් සිනා සී තමා අත තිබූ ගිණි පෙට්ටිය අපේ සහෝදරයා අත තිබ්බාලු.

P.K.නෝටන් පෙරේරා
034-2226914/ 071-8206957



Points to Ponder

## TEN COMMANDMENTS OF QUALITY SERVICES

1. **Speak to people**
   There is nothing as nice as a cheerful greeting

2. **Smile**
   It takes 872 muscles to frown -
   only 14 to smile .......

3. **Call people by name**
   Everyone is pleased when you remember their name ......

4. **Be friendly & helpful**
   and others will respond in like manner ...........

5. **Speak & act.**
   as if everything you do were a genuine pleasure

6. **Be genuinely**
   interested in people .............

7. **Be generous with praise -**
   Cautious with criticism .......

8. **Be considerate**
   with the feelings of others,
   it will be appreciated ...........

9. **Be thoughtful**
   of the opinions of others, there are 3 sides to any controversy
   yours, the other person's & the right one ?

10. **Be willing**
    to give service, what counts most in life is what we do for others........

**(Matale old Thomians gettogether Magazine 1995)**

(15 වැනි පිටුවෙන්..................)

ගෙදර දොරෙත් ඔක්කොම වැඩ කරගෙන, පොඩි එකාවත් බලාගෙන, මටත් වෙලාවට කන්න උයල දීල කරදරයක් නැතුව හිටියනෙ. මීට පස්සෙ නං මම එයාට අරියාදු කරන්නෙ නෑ" යි ඔහු සිතුවේය.

තම බිරිඳ සිටින නැන්දම්මාගේ ගෙදරට ඔහු ගියේ මදක් ලජ්ජාවෙනි.

ඔවුන් එනු දුටු එමලින් මිදුලේ සිට ගේ ඇතුළට ගියාය.

"අම්ම ගෙයි ඇති පුතේ. ගිහින් අඬගහගෙන වරෙන්" යි ඔහු තම දරුවා බිමට බස්සවා කීවේය.

"අම්මෙ අම්මේ" යි ශබ්ද නගමින් ඔහු විගස මවට කතාකළේය.

"අනේ ඇයි පුතේ ? ඔයා ආවද ?" යි ඈ ගෙයින් එළියට පැමිණ ඇසුවාය.

"අම්මෙ මට තාත්ත ගැහුව. මට බඩගිනියි" යි කියමින් ඔහු අඬන්නට පටන් ගත්තේය.

"අනේ අපොයි. මං ජීවිතේට මේ දරුවට නිය පිටින් පාරක් ගහල නෑ. කොහේටද පුතේ ගැහුවේ ?" යි ඈ ප්‍රශ්න කළාය.

"මගේ මේ පපුවට ගැහුවා" යි ඔහු උරඉස පෙන්නුවේය.

"ගැහුවේ නෑ එමලින්, නිකං පොඩි තට්ටුවක් දැම්ම විතරයි උර ඉස්සට. කියන දෙයක් අහන්නෙම නෑ" යි සූටින් කීවේය.

"නෑ මට හයියෙන්ම ගැහුවා. අම්මෙ යංකො ගෙදර. මට තාත්ත ගහනවා. හයියෙන්ම ගහනවා" යි කියමින් ඔහු යලිත් අඬන්නට පටන් ගත්තේය.

"අනේ එමලින් යමු ගෙදර, මාව වැඩකටත් හොයන්න ආව" යි සූටින් කිවේය.

"එහෙනං පොරොන්දු වෙනව මීට පස්සෙ මට කවදාවත්ම ගහන්නෙ නෑ කියල. මේ බලන්න මගේ දතකුත් කැඩුන ඊයේ"

"අනේ අම්මප නෑ එමලින්. මේ සූටින් කිව්වොත් කිව්වම තමා.

"හා එහෙනං පොරොන්දු වෙන්න මිට පස්සෙ ඔය ගිනි වතුර බොන්නෙ නෑ කියල" යි ඈ කීවාය.

"අනේ අම්මප නෑ එමලින්, නෑ කිව්වොත් නෑමයි. මේ සූටින්ගෙ හැටි දන්නවනෙ. කිව්වොත් කිව්වාම තමා. අනේ අම්මපා" යි ඔහු පොරොන්දු වූයේය.

"හා එහෙනං යමු" යි කියමින් ඈ තම දරුවා වඩා ගත්තාය.

"එමලින් මම ඉතින් ඇඟ මහන්සි වෙලා දවස පුරාම බර වැඩ කරන මිනිහනෙ. ඉතින් මං මේ කියන්න හැදුවෙ ඇගේ පතේ අමාරු යන්න හින්ද හැන්දෑවට විතරක් චූට්ටත්තක් බිව්වාට කමක් නෑ නේද" ඔවුන් මද දුරක් ගිය පසු ඔහු බැගෑපත්ව ඇසුවේය.

"හා එහෙනං ඔන්න ඩිංගයි බොන්නෙ. ඉස්සර වගේ කෙලින් හිටින්න බැරි තරමට බොනව හෙම නෙවෙයි" යි ඔහු ගැන අනුකම්පාවක් ඇති වී ඈ කීවාය.



පී.ඩී. අබේපාල
0112 268849

**Points to Ponder**

## Q & A

Q) Why is a snake clever ?
A) Because you can't pull its leg

Q) What kind of birds are kept in captivity ?
A) Jail birds.

Q) What's the definition of CID ?
A) Copper in disguise

Q) What do drunken chickens lay ?
A) Scotch eggs.

Q) Which fish live in heaven ?
A) Angle Fish.

Q) Where do dogs go when they lose their tails ?
A) To the re-tailer

Q) What is easy to get into-but hard to get out of ?
A) Trouble.

Q) What do people sing in their boaths ?
A) Soap operas.

**(Matale Old Thomian's gettogether Magazine 1995)**

Points to Ponder

## Life is limited but knowledge is not

Slowly and steadily we must encounter life . Innovated to produce concrete results of sensibility appeases the efforts of our present mode of living. Determines and justify our actions. Leaving to the future to leave the brunt of all it's consequences and repercussions. Thus we must stay alive to the drastic involvements disrupting a normal way of existence. Cultivating prudence in our attitudes to our society is a must. Remember, there is many a slip, between the cup, and lip. The first particles of knowledge, gathered through diverse avenue hears the power to produce better humans. To become exemplary, in conduct, and disciplined in all words and deeds, in our associations with others. Do not make doing nothing a part of your life . The greatest irony is retiring to bed ignorant and remain same as when we are awakened, with so much learning to be done, grasping everything good. Our efforts to be loyal citizen must be encouraged and complemented. Our duty to our Mother Lanka is !!!

One Action a Day. Keep all Happy and Gay.
Even the Doctor away
Excuses will not pay.



**F.R.Irugalbandara.**

## ඒබ්‍රහම් ලින්කන් සිය, දයාබර පුත්‍රයාගේ මුල් ගුරුතුමාට යවන ලද ලෝක ප්‍රකට ලිපිය !

''මුල් ගුරුතුමනි, මගේ පුතාට කියා දෙන්න හැම මනුෂ්‍යයකුම සත්‍යවාදී සහ සර්ව සාධාරණ නොවන බව. ඔහුට කියා දෙන්න හැම තක්කඩියකු, දුර්ජනයකු පාසා ම ගුණයහපත් වීරවරයකුත් මේ ලෝකයේ සිටින බව. ඒ කියන්නේ හැම දෙනා ම තක්කඩින් නොවේ. තක්කඩින් වාගේ ම, යහපත් උදවියත් සිටිනා බව මගේ පුතාට උගන්වන්න. සෑම ආත්මාර්ථකාමී දේශපාලනඥයකු වෙනුවට රටේ සුබසිද්ධියට කැප වුණු යහපත් දේශපාලනඥයකුත් ඉන්නා බව. මගේ පුතාට ඒත්තු ගන්වන්න, සෑම සතුරෙකු පාසා ම මිතුරෙකුත් සිටිනා බව මගේ පුතාට කියා දෙන්න. ඒ වගේම කියාදෙන්න නොමිලයේ කාගෙන් හරි කොහෙන් හරි ලැබෙන ඩොලර් පහට වඩා, තමාගේ දහඩිය මහන්සියෙන් උපයන ඩොලරය වටිනාකමින් වැඩි බව. ඒ බව ඔහුට ඒත්තු ගැන්වීමට කලක් ගතවන්නට පුළුවන් බව මා දන්නවා. නමුත් ඒ සත්‍යය ඔහුට උගන්වන්න.

පරාජය විඳ දරාගැනීමටත්, ජයග්‍රහණය නිහතමානී ව සතුටින් බුක්ති විඳීමටත් මගේ පුතාට උගන්වන්න. ඇතැම් උදවිය ඊර්ෂ්‍යාකාරී ව ඔහු යටපත් කරන්නට, ඈත් කරන්නට ක්‍රියා කරන විට ඒවා ගැන කලකිරීමෙන් තොර ව සන්සුන් ව සිටිමින්, සිත යටින් සිනාසෙන්නට හැකි ශක්තිය, රහස ගැන ඔහුට උගන්වන්න. තමන්ගේ හයිහත්තිය පෙන්වා මිනිසුන් බියගන්වන්නට එන අය මේ ලොව පරාජය කිරීමට පහසු ම අය බව ඔහුට අවබෝධ කරවන්න.

මුල් ගුරුතුමෙනි, ඔබට හැකි නම් ඔහුට පොතේපතේ ඇති චමත්කාරය පෙන්වා දෙන්න. එපමණක් නොව අහසේ සැරිසරන කුරුල්ලන්, හිරු රැසේ පියාඹන මීමැස්සන්, නිල්වන් කඳු බෑවුමක පිපී වැනෙන මල්, කියාපාන සදාතනික රහස ගැන ඔහුට නිවිසැනසිල්ලේ සිතන්නටත් ඉඩ හරින්න.

වංචා කිරීම, හොරමැරකම් කිරීමට වඩා පරාජයට මුහුණ දීම ගෞරවාන්විත බවත් අනෙකුත් අය කුමක් කීවත් තමන් ගේ අවංක අදහස් ගැන විශ්වාසය තබා ක්‍රියා කිරීම ඉතා වටිනා බවත් මුල් ගුරුතුමනි, ඔහුට වටහා දෙන්න. ඒ වාගේ ම මුල් ගුරුතුමනි,මගේ පුතා පුරුදු පුහුණු කරන්න මෘදු මොළොක් මිනිසුන්ට මෘදු ලෙස සලකන්නටත්, රළු මිනිසුන්ට රළු ලෙස

සලකන්නටත්, තමන් වටේ සිටින උදවිය කරන දෙය අන්ධානුකරණයෙන් පිළි නොගෙන තමාගේ ම බුද්ධිය මෙහෙයවා යුතුකම අයුතුකම තේරුම් ගෙන ක්‍රියා කිරීමේ ශක්තිය ඔහුට ලබා දෙන්න. සෑම කෙනෙකුට ම සවන් දීමට ඔහුට උගන්වන්න. එහෙත් ඔහු අසන දෙය සත්‍යය අනුව කිරා මැන බලා හොඳ දේ පමණක් ගන්නට ඔහුට හැකියාව ලබා දෙන්න. තමන්ගේ හිතේ ශක්තිය වැඩි ම මිලට ඉල්ලන්නන්ට විකුණුවත්, තමන්ගේ හදවත සඳහා කිසි විටෙකත් මිලක් නො ඉල්ලන්නට ඔහුට උගන්වන්න. බොරු ඝෝෂාවල් කරන සෙනග මධ්‍යයේ කන් පියාගෙන ඉන්න ඔහුට ධෛර්යය දෙන්න. නමුත් සත්‍යය යයි පිළිගන්නා දේ වෙනුවෙන් ධෛර්යවත් ව සටන් කරන්නට ඔහුට උගන්වන්න.

මුල් ගුරුතුමනි, ඔහුට මෘදු ලෙස සලකන්න. නමුත් ඔහු හුරතල් කරන්නට එපා. වානේ හොඳින් තැනිය හැක්කේ ගින්නෙන් රත් වූ විට බව ඔහුට පැහැදිලි කරන්න. ඒ නිසා ජීවිත ගමනේ දී තමාට හැඩි දැඩි රශ්මියක් දැනුණොත් එයින් තේරුම් ගන්නට සලස්වන්න. ඔහු කාට වත් යටත් කරන්න බැරි මිනිසකු හැටියට, දියුණු වීමට ඒ අත්දැකීම ප්‍රයෝජනවත් වන බව.

ධෛර්යවත්ව දරාගත යුතු නිර්භීතකමට අවශ්‍ය ඉවසීම ඔහුට තිබිය යුතුය. හැම විට ම තමා ගැන උදාර උසස් විශ්වාසයක් ඇති කරගන්නට ඔහුට උගන්වන්න. මුළු මහත් මිනිස් වර්ගයා ගැන ම එබඳු විශ්වාසයක් ඇති කරගන්නට පුළුවන් වන්නේ එහෙම කළොත් පමණයි. එහෙත් ඔහුට මේ කියන අධ්‍යාපනය ලබා දීම බැරෑරුම් කාර්යයක් බව මා දන්නවා. ඒ නිසා මුල් ගුරුතුමනි, ඔබට හැකි හැම දෙයක් ම මගේ දරුවා වෙනුවෙන් මේ ආකාරයට කරන්න. එපමණයි, මගේ දරුවා ඒ අයුරු පන්නරය ලබන බව මට විශ්වාසයි.

- ඒබ්‍රහම් ලින්කන් -

උපුටා ගැනීම - Lincon the Unknown
by Dale Carnegie

පරිවර්තනය නොහඳුනන ලින්කන්
- ගාමිණී කුමාර විතාන

සැපයුවේ - ජිනදාස හේරත්
0112-912007
077 - 2132750

Points to Ponder

## "ආත්ම දැනීම තුළින් ....."

අපගෙන් වැඩිදෙනා තරමක් නිද්‍රාශීලිය. අප වඩාත් කැමති වී සිටින්නේ, කැමතිවන්නේ අපේ පැරණි රටාවන් තුළ අපට පුරුදු වී ඇති විවිධාකාර චින්තනයන් සමග ජීවත්වීමටය. දත්දෙය සමග විසීම නොදත් දෙය සමග විසීමට වඩා හොඳයයි කල්පනා කරන බැවින් අපි අලුත් දෙය ප්‍රතික්ෂේප කරමු. දන්නා දෙය තුළ සුරක්ෂිතභාවය ඇත. අප සිතන්නේ එසේය. ඒනිසා දත්දෙය නම් ක්ෂේත්‍රය තුළ අපි වැඩකරමු. අරමුණු සඵල කරගැනීමට දඟලමු. එකම දෙය නැවත නැවතත් කරන්නෙමු. සිදුවන්නේ එයයි. ආපසු හැරී බලන විට සිදුව ඇත්තේ කුමක්ද ? දැකිය හැක්කේ කුමක්ද ? අළුතෙන් කිසිත් සිදුවී නොමැත. පුනරාවලෝකනය කර බැලීමට තරම් අර්ථවත් දෙයක් බොහෝවිට නැමැත. සිත් වේදනා සහ පසුතැවිලිවීම් පමණක් ඉතිරි කොට කාලය ගෙවිගොස් ඇත. දුර්ලභ වූ මිනිස් ජීවිතයෙන් අප ලබාගත් ප්‍රයෝජනය කුමක්ද ? අපගෙන් පවුලට - නෑදෑ හිතවතුනට - සමාජයට ඉටුවූ සේවය කුමක්ද? අපි ආත්මාර්ථකාමීන් වෙමු. අප සිතා ඇත්තේ අපගැන පමණකි. එනම් අපේ වැදගත්කම, අපේ ප්‍රශ්න, අපේ දුක් දොම්නස් හා ගැහැට යන මේවාගැනය. අප විසින් කරනු ලැබූ සහ කරනු ලබන හැම දෙයක් සඳහාම සම්පූර්ණ වගකීම අපගේයයි අප කිසි විටෙකත් සිතනු ලැබුවේද ? අපකරන හැමදේටම අප අතිශයින්ම වගකිවයුතුයයි අපට නොහැඟේ. එමෙන්ම එය තේරුම් නොගන්නෙමු. බාර නොගන්නෙමු, පරිසරය - සමාජය - දෙමාපියන් - එසේ නැතිනම් ජන්ම උරුමය යන මේ කුමක් හෝ පිට වරද පටවා නිකම් සිටීමට හේතුවක් සොයනවා මිස කවදාවත් අප ම යමක් කිරීමට ඉදිරිපත් වන්නේ නැත. උත්සාහ කරන්නේ ද නැත.

මනුෂ්‍යයන් වන අපට උනුන් සමග සාමයෙන් මිත්‍රත්වයෙන් ජීවත්වීමට කවදාවත් හැකිව නැත. අපි ඒ ගැන විශාල වශයෙන් කථාකරමු. කථාවෙහිදී නම් අපතරම් සුචරිතවාදී අහිංස මානව හිතවාදී පුද්ගලයෝ තවත් නොවෙති. සුහදත් වය උතුරායති. එහෙත් අප රුචිනොකරන්නාවූ ඉතා සුළු සිද්දියක් වුවද ඒ ඉහත කී සියල්ල අභිභවා උනුන් මරාගැනීම දක්වා වර්ධනය වියහැකි ප්‍රකෝපකාරී සිතිවිලි අප

වෙලාගනියි. විරෝධය පෑම සහ එකටෙක කිරීමේ හැඟීම වලින් වෙළී නොකළයුතු බොහෝ දේ කිරීමට පෙළඹේ. මේ සිතිවිලි වලින් මිදීමට නිදහස් විමට අප කවරදාවත් සිතා නොමැත. නොඒසේ නම් උත්සාහකර නොමැත. මේ නිසාවෙන්ම අප විවිධ භය - දුක්විඳීම් - දෛනික ජීවිතයේ වේදනා යනාදියෙන් වෙළී ජීවත්වෙමු. සාමය සහ සැනසුම අපට කවදාවත් නොමැත. අපි හැමදාම ගැහැටින් යුතුව සිටිමු. එය අපගේ ජීවිතයේ කොටසකි.

සැපත සහ ප්‍රීතිය ආසාවෙන් වැලඳ ගනිමින් විපත සහ වේදනාව බැහැර කළහැක්කේ කෙසේද? සැපත සහ විපත ප්‍රීතිය සහ වේදනාව හෝ සැප හා දුක වෙන වෙනම නොව එකිනෙක හා වෙළී ඇති හැඟීම් අප තුළට පිවිසෙන්නේ එකිනෙක හා වෙලී හෝ එකිනෙක තුළ සැඟවී හෝ එකිනෙක පසුපස ලුහු බඳිමිනි. එසේ හෙයින් එකකට ඇලුම් කරමින් අනෙකක් තුරන් කරන්නට අප දරණ වෑයම සාකල්‍යයෙන්ම නිරර්ථකය. තමා පිළිබඳව - තමාගේ සිත පිළිබඳව - තමාගේ සිතතුළ උපදින සිතිවිලි පිළිබඳව දැනීමක් සහ අවබෝධයක් තමාතුළ තිබිය යුතු වේ. ආත්ම ඥානය - ආත්ම විමර්ශනය - ආත්ම දැනුම යනුවෙන් හැඳින් වෙන්නේ මෙයයි. ආත්ම දැනීම තුළින් බොහෝ දේ අවබෝධ කරගත හැකිය.

සංවේදීවීම යනු අනුකම්පාව ඇතිවීමයි. මනසට කාවදින අදහස් පිළිගැනීමයි. සැබෑ ත්‍යාගශීලි භාවය යනු මනසටම සීමාවූ දෙයක් නොවේ. එය කවර හෝ දෙයක් කොපමණ සුළුවෙන් හෝ ඔබ සතුව තිබුනත් එය තවකෙනෙකු හා බෙදා ගැනීමට ඇති ඕනෑකමයි. මේ ආදර - මේ ත්‍යාගශීලි මේ කාරුණික - මේ මෘදුහැඟීම ඔබතුළ කුඩාකල සිටම ඇතිවිය යුතුය. ඇතිකරගත යුතුය. ඔබතුළ එය ඇත්නම් අන්‍යයන් තුළද එය අවදිකළ හැකිය.

ජේ. ක්‍රිෂ්ණමූර්ති

උපුටා ගැනීම : THE NETWORK OF - HOUGHT
සිංහල පරිවර්තනය : මහාචාර්‍ය මහින්ද පලිහවඩන
සම්පාදනය : පද්මා හේරත්- 011-2912007
077-2132750

**Points to Ponder**

## QUOTABLE QUOTES

♦ We must view young people not as empty bottles to be filled, but as candles to be lit

(Robe't Shaffer)

♦ There is a great man who makes every man feel small. But the really great man is the man who makes every man feel great.

(Chinese proverb)

♦ The best preparation for tomorrow is to do today's work superbly well.

(Sir William Osler)

♦ Silence is a true friend that never betrays.

(Confucius)

♦ I am not interested in excuses for delay, I am interested only in things done

(Jawaharlal Nehru)

♦ My grandfather once told me that there are two kinds of people in the world namely those who do the work and those who take the credit. He told me to try to be in the first group, as there is less competition there (Indira Gandhi )

♦ I am a great believer in luck and I find that the harder I work, the more I am in luck

(Stephen Leacock)

♦ Life is like riding a bicycle. You don't fall off unless you stop pedling

(Claude Pepper )

## A GESTURE OF FORGIVENESS

Points to Ponder

A young man had fallen into bad ways. Indeed, he went so far that he finally ended up in prison. There he had time to reflect. This brought him round to a new way of thinking and he determined to start a new life, once he had served his sentence. Yet he knew that he had deeply hurt his parents and brought shame on them by his behaviour. He was afraid to return home, but where else could he begin a new life if not at home ?

And so he wrote this letter his parents: " I know what I have done to you and I beg your forgiveness for every thing ." Then he told them the date of his release and added that he would be travelling that same day by train to his home village. He asked them to hang a white linen cloth on the lime tree in front of their house if they felt able to forgive him. He would be able to see the tree from the train and would either get out or journey on, depending on the response....

He was so frightened, he secarcely dared to look, as the train slowly drew within sight of his parent's house. But at last he plucked up the courage, and could scarcely believe his eyes. For the big tree was covered all over with white cloths!

**Source : Medjngorje News**
**Sent by : Yvonne Amarasekara.**

## BITS & PIECES

✵ Temper is what gets most of us into trouble, and pride is what creates the temper most of the time.

✵ When you get angry count upto ten. When you get very angry count upto hundred.

✵ When friends are in trouble, don't bothr them by asking if there is anything you can do. Think of something appropriate and do it.

✵ If you are feeling low, don't dispair. The sun has a sinking spell every night, but it comes back up every morning.

✵ Nothing will be resting, if you are not interested.

✵ There is nothing that a man cannot do, if only he does not care who takes the credit.

✵ Invest your time, don't just spend it, don't cunt time by days hours and minutes, but count it by the mumber and quality of achivements.

## IMPORTANT WORDS

**The Six Most Important Words**
" I Admit I made A Mistake "

**The Five Most Important Words**
" You did A Good Job:

**The four Most important Words**
" What is Your Opinion "

**The Three Most Important Words**
" If you Please "

**The Two Most Important Words**
" Thank You "

**The One Most Important Word**
" We"

## Next Volume

Please forward all your writings including articles, poems, stories, comedies etc., filled with your emotions, feelings, knowledge and creativity for the next volume of "sandewa".

With that if you can send a recently taken Photograph of yourself with mentioning your name, it will be highly appreciated.

Editor

56/5.
"Amara-Mal"
Galthude,
Panadura.
038-2234226

### මීළඟ කලාපයට.....


සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන්ම ලියු ඔබගේ ලිපි, කාව්‍ය, ප්‍රබන්ධ සහ හස රස බස් සහිත රචනා, කෙටියෙන් හා පැහැදිලිව ලියා 'සැඳෑව' වෙත ඉක්මණින්ම යොමු කරන්න.

එම නිර්මාණ සමග ඔබගේ නම සඳහන් කරන ලද, මෑතකදී ගනු ලැබූ ඡායාරූපයක් ද එවන්නේ නම් මැනවි.

- සංස්කාරක -

සැඳෑව

ශ්‍රී ලංකා
මහ බැංකු විශ්‍රාමිකයන්ගේ
සංගමය
2013 ඔක්./ දෙසැ. කලාපය.



වෙබ් අඩවිය : www.sendewa.org විද්‍යුත් ලිපිනය info@cbpa.com
අංක : QD/55/News/2013 යටතේ ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලදී.




Mr. Miktham
Creative Fast
36/3, B-1
IDH Road
S'alamulla
Kolonnawa

ගරු ලේකම්,
මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය,
8/1, ග්‍රීන් පාත්, කොහුවල.

රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවත, අංක 58 දරණ ස්ථානයේ පිහිටි
මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදුව
ශ්‍රී ලංකා මහ බැංකුවේ විශ්‍රාමිකයින්ගේ සංගමය විසින් නිකුත් කරන ලදී.

GWPa